The artistic excellent, the variety and lightness the Sri Lankan masks have made them very popular among tourists with the spread of this art in the Ambalangoda region, not only traditional Kōlam artists but also others took to mask industry. The fact that with a number of sales centers of masks have been located in the Ambalangoda region explains this position. The art of fashions masks did not become popular in other areas which are prevailing the Kōlam theatre than Ambalangoda. The economy of these areas depended on traditional Plantations, agriculture and various urban-based professions, the fact furnished above explain the socio-economic and cultural background of Kōlam theatre, has it was affected in the advent of the open economy and now the Kōlam theatre is moves away from the social as a living art.

## References

Arasarathnum, S. (1969). lankave Landesi balaya. 1658-1687.Colombo: Dept of Education Published.

Bryce, Ryan. (1993). Caste in modern Ceylon. New Delhi: Navrang. Census. (2001).

Dharmabandu, T.S. (1962). Kaurawa vansa kathava. Moratuwa: D.P. Dodangoda & company.

De Silva, Ginendravansa. (1999). Ambalangoda Puranaya. Ambalangoda: Nagarasabava.

Darmadasa, K.N.O. (1999). Kōlam, Sinhala wishwakosa udtruti. Colombo: Sanskrutika katauthu Amathyansaya.

Devi, Ragini (1990). Dance Dialects of India. 2nd Edition. Delhi: Motilal Barnasidas.

Gunatilaka, M.H.(2007). Kōlam nataka ha Lankawe ves muhunu. Colombo: Rathna book Publisher.

Pertold, Otaker. (2006). Ceremonial dances of The Sinhalese. Dehiwala: Thisara prakasakayo Ltd.

Roberts, Michael. (1982). Caste Conflict and Elite Formation. Colombo: Lake house Investment Ltd.

Regional secretary division, (2000). Parisarika pethikada. Matara district.

Sarachandra, E.R. (1968). Sinhala gemi natakaya. Colombo: Dept of Cultural affaires.

Sinhala visvakosaya. (1963).1.kandaya, Colombo: Department of Cultural.

# අලගියවන්න මුකවෙටි කවියාගේ සාහිත්‍ය සේවය පිළිබඳ විමර්ශනයක්

කේ. ජී. අමරසේකර

දහසය වැනි ශත වර්ෂයේ ආරම්භයේ පටන් පෘතුගීසීන්ගේ පාලනයට ලංකාවේ මුහුදු බඩ පළාත් නතුවීම නිසා මෙරට සමාජ ව්‍යුහයේ විපර්යාස රැසක් ම උද්ගත විය. එකල ලංකා ඉතිහාසයේ අඳුරු කාලයක් සේ සනිටුහන් වීමට තරම් පෘතුගීසීන්ගෙන් සිදු වූ අහිතකර බලපෑම් ඉමහත් විය. මෙරට ජනතාවගේ සිරිත්-විරිත්, සිතුම්-පැතුම්, අඳුම්-පැළඳුම්, සමාජ ව්‍යවහාර, භාෂා සාහිත්‍ය, ආකල්ප, ඇදහිලි විශ්වාස ආදි සෑම දේක ම පෘතුගීසින්ගේ බලපෑම පිළිබිඹු වන්නට විය. 1530 න් පමණ පසුව භික්ෂූන්ට පමණක් නොව ගිහියන්ටද බෞද්ධ අනන්‍යතාවෙන් යුතුව පෙනී සිටීමට නොහැකි තත්ත්වයක් මතු වූ අතර නිජබිම් අතහැරීම ක්‍රිස්තියානි ධර්මය වැළඳ ගැනීම නොවී නම් ඝාතනයට ලක්වීමට පවා සිදුවිය. පෘතුගීසින්ගේ පැමිණීමෙන් සමාජයේ හටගත් විපර්යාසය, සංස්කෘතික පෙරළිය[1] සාහිත්‍යය තුළින් ඉස්මතු වූ ආකාරය අලගියවන්නයන්ගේ කෘති තුළින් ප්‍රත්‍යක්ෂ වේ.

සීතාවක රාජ්‍ය සමයෙහි ප්‍රසිද්ධ ගත්කතුවරයෙකුව සිටි අලගියවන්න මුකවෙටි ක්‍රි.ව 1552 ත් 1620 ත් අතර කාලයෙහි ජීවත් වූවෙකි. ඔහුගේ පියා ධර්මද්වජ නම් වූ පඬිවරයෙකි. අලගියවන්න යනු ඔහුගේ සංඥා නමය යි. මුකවෙටි යනු පදවියකි. කෝට්ටේ අවධියේ සිටම පැනෙන එය රජුගේ ලේකම් පදවිය සේ සැලකේ. අලගියවන්නත් එම පදවිය දැරූ කෙනෙකු ලෙස පිළිග ැනේ. සැවුල් අස්න, දහම්සොඬකව, කුසදාකව, සුභාෂිතය හා කුස්තන්තීනු හටන යන කෘති අලගියවන්න කවියා විසින් රචනා කරනු ලැබ තිබේ.

**සැවුල් සන්දේශය**

අලගියවන්නයන්ගේ නිර්මාණයක් වන සැවුල් සන්දේශය සම්භාව්‍ය සිංහල සන්දේශාවලියෙහි අවසන් කෘතිය වශයෙන් සැලකෙයි. රාජසිංහ රජුට හා බුදු සසුනට දේවාසිරි පතා රචිත මේ සන්දේශය පද්‍ය 206 කින් යුක්ත වූවකි. සීතාවක රාජසිංහ රජු සමයේ දී ම මේ සන්දේශය රචනා කොට ඇත. මෙහි කතුවරයා අලගියවන්නයන් බව

සොඳුරු සකු මගද කිවි නළු සිඳු කිමිදී
මිතුරු නොවන කිවි ගජ සිහ සිරින් බිඳී
සොඳුරු අලගිවන් මුකවෙටි නමැති සුදී
මියුරු පද රසැති මෙසැවුල් අස්න යෙදි[2]

යන පද්‍යයෙන් තහවුරු වෙයි. සීතාවක රාජධානියේ සිට සපරගමු සමන් දේවාලයේ මහ සමන් දෙවිඳුන් වෙත සන්දේශය යවා තිබේ. මෙහි බුදු සසුනට දේවාසිරි පැතීම අරමුණක් සේ දැක්වෙන හෙයින් ඔහු ශිව දහම වැළඳ ගැනීමට පෙර මේ කෘතිය රචනා වූ බව තහවුරු වෙයි. සන්දේශකරණයෙහි අභ්‍යන්තර අරමුණ වී ඇත්තේ රාජසිංහ රජු උත්කර්ෂවත් අයුරින් වර්ණනා කිරීම බව රජු පිළිබඳව ඉදිරිපත් කෙරෙන දීර්ඝ වර්ණනාවෙන් පැහැදිලි වෙයි. රාජ වර්ණනාවෙහි ආරම්භක පද්‍යය මෙසේය:

හරතුරු රාජ විලසින් යසැති නොවිතර
නිසි මනු රාජ කුලයෙන් පැවතෙන පවර
රුපු පර රාජ මත රජ බැඳි කෙසර යුර
දිනවර රාජ සිහ නරනිඳු සඳ මිතුර[3]

මෙසේ ආරම්භ වන කවි පෙළ අවසන් වන්නේ පහත සඳහන් පද්‍යයෙනි

දහසක් වතිනි දහසක් වර හැම දවස
දහසක් වස් කිවත් නොගෙවෙන මොහු යසස
වසිනෙක් සිය ආයු ලැබ නර පණුව වැස
මම එක් මුවින් පවසා නිමවමි කෙලෙස[4]

සැවුල් සන්දේශය රචනා කිරීමේ දී පෙර කවීන් සන්දේශ කාව්‍ය රචනයේ දී අනුගමනය කළ ආකෘතියෙන් බැහැර නොගිය අප කවියා රාජසිංහ රජතුමා පිළිබඳ ව වර්ණනා කිරීම සඳහා එහි 33 වැනි පද්‍යයේ පටන් 72 වැනි පද්‍ය දක්වා එක දිගට පද්‍ය 40ක් පමණ මිඩංගු කොට දීර්ඝ වර්ණනාවක් කිරීම පමණක් විශේෂත්වයක් ලෙස දැක්විය හැකිය.

**දහම්සොඬ කව**

සිංහල සම්භාව්‍ය සාහිත්‍යාවලියෙහි දහම්සොඬ කවට හිමිවන්නේ සුවිශේෂත්වයකි. ගෞතම බෝධිසත්ත්ව චරිතය වස්තු විෂය කොට ගනිමින් විරචිත මෙය පාලි රසවාහිනියේ දහම්සොඬ වර්ගය ආභාසය කොට ගත්තකි.[5] ධම්මසොණ්ඩක ජාතකය නමින් පසු කලක දී සිංහල ජාතක පොතේ ඇතැම් පිටපත්වලට ඇතුළත්ව ඇති මෙහි වර්තමාන කථාව අප්‍රකට ය. එය පාලි අටුවාවෙහි ද දක්නට නොලැබේ. කෙසේ වුවද මුල් කාලීන ජාතක පොත්හි මේ ජාතකය ඇතුළත් නොවන අතර ගම්පොළ රාජ්‍ය සමයේ දී දෙවන ධර්මකීර්ති සංඝරාජයන් වහන්සේ විසින් රචිත සද්ධර්මාලංකාරයෙහි ධර්මසොණ්ඩක වස්තුව නමින් මේ කථා පුවත ඇතුළත් කොට ඇත. තදනන්තරව සීතාවක රාජ්‍ය සමයේ දී මේ කථා වස්තුව පද්‍යයෙන් ප්‍රතිනිර්මාණය කරනු ලැබ දහම්සොඬකව යනුවෙන් ප්‍රකට ව ඇත. ඇතැම් පිටපත්හි එය දහම්සොඬදා කව යනුවෙන් ද සඳහන් ය.

ධර්මසොණ්ඩක වස්තුවෙහි අන්තර්ගතය ලොව්තුරු දහමෙහි අගය හුවා දක්වන ජනප්‍රිය කතාවකි. එය ගෞතම බෝධිසත්වයන් වටා ගෙතී ඇත. එකල අප බෝසතාණන් වහන්සේ රජකුලයෙහි ඉපදී දඹදිව අග රජ ව බුදුන් වහන්සේ විසින් වදාරන ලද ධර්මය අසන්නට නොමැතිව නොයෙක් කාරණා සිතින් සලකා කලකිරී අමාත්‍යවරුන්ට රාජ්‍යය පාවා දී ධර්මය සොයනු පිණිස වනගතව තැවෙමින් සිටියහ. එවිට ඒ බව දැනගත් ශක්‍ර තෙමේ රකුසු වෙස් ගෙන පැමිණ තමා ධර්මය දන්නා බවත් එය කීමට කවර උපකාරයක් තමා හට කරන්නේ දැයි ඇසිය. ඒ අවස්ථාවෙහි දෙදෙනා ඇතිකර ගත් ගිවිසුමක්

අනුව බෝසතාණන් වහන්සේ ගිරිමුදුනක සිට රජකු වෙස් ගෙන සිටින ශක්‍රයා"අනිච්චා වත සංඛාරා" යනාදි ගාථාව කියමින් සිටිය දී ඔහුගේ මුඛයට පැන්නහ. එයින් සතුටට පත් ශක්‍ර දෙවියා රජතුමා දෙව්ලොවට කැඳවා ගෙන ගොස් සුරපුර සිරි පෙන්වා අවවාද කොට නැවත මනුලොවට ඇරලීය.

මේ කථා පුවත පද්‍යයෙන් ප්‍රතිනිර්මාණය කිරීමේ දී ජාතක පොතේ ඇතැම් පිටපත්හි ලුහුඬින් දක්වා ඇති ධර්ම සොණ්ඩක ජාතක කථාව නොව ඉතා පිළිවෙළට විස්තර සහිතව සම්පූර්ණ ලෙස දක්වා ඇති සද්ධර්මාලංකාරයෙහි ධර්මසොණ්ඩක වර්ගයෙහි දැක්වෙන ධර්මසොණ්ඩක වස්තුව මූලාශ්‍රය කොට ගෙන ඇති බවට ඒවා මනාව පරීක්ෂා කිරීමේ දී හමුවෙන විවිධ කරුණුවලින් තහවුරු වේ.

අලගියවන්නයන් සද්ධර්මාලංකාරයෙහි එන ධර්මසොණ්ඩක වස්තුව කියවා කථා සාරය මනාව අවබෝධ කර ගැනීමෙන් අනතුරුව කාව්‍යයෙන් ප්‍රතිනිර්මාණය කිරීමේ දී උපක්‍රම කිහිපයක් භාවිත කොට ඇත. ඒ අතර,

01. මූලාශ්‍රයෙහි කෙටියෙන් දක්වා ඇති ඇතැම් කරුණු දීර්ඝ වසයෙන් විස්තර කිරීම.
02. මූලාශ්‍රයෙහි සවිස්තර ස්ථාන අවශ්‍ය පරිදි සැකෙවින් ගෙනහැර දැක්වීම.
03. මූලාශ්‍රයෙහි සඳහන් ඇතැම් කරුණු සංස්කරණය නොකර එලෙසම කවියට නැගීම.
04. මූලාශ්‍රයෙහි ඇතත් කාව්‍යයට එතරම් වැදගත්මක් නැති ඇතැම් කොටස් සහමුලින් ම බැහැර කිරීම.
05. කාලීන සමාජයේ පිළිගැනීම ඇතිවන පරිදි හා කාව්‍ය සන්දර්භය සම්බන්ධ උචිත භාවය සලකා අවශ්‍ය යැයි සිතන ඇතැම් කරුණු අලුතින් එකතු කිරීම.
06. මූලාශ්‍රයෙහි ඇති සංස්කෘත පද බහුල යෙදුම් ඉවත් කොට කාව්‍ය සඳහා සරල බස් වහරක් යොදා ගැනීම.
07. හැකි තරම් කථා සාරය පිළිබඳ අවධානය යොමු

කරමින් ඊට හානි නොවන පරිදි ස්වාධීනව කාව්‍ය නිර්මාණය කිරීම සඳහා උත්සුක වීම.

08. මූලාශ්‍රයෙහි ස්ථාන කිහිපයකම ''එසේ හෙයින් කියන ලදි'' යනුවෙන් සඳහන් කොට අනතුරුව දක්වා ඇති පාලි ගාථා සහමුලින් ම බැහැර කිරීම.

09. මූලාශ්‍රයෙහි එන ඇතැම් සිද්ධි තම මතයට වෙනස් කර තිබීම ආදිය පෙන්වා දිය හැකිය

**කුසජාතක කාව්‍යය**

දඹදෙණි රාජධානි සමයෙහි කාව්‍ය ශාස්ත්‍රයේ පරිහරණය වන විරිත් ඉගැන්වීම සඳහා ලියන ලද එළුසඳැස් ලකුණ නමැති ග්‍රන්ථයෙහි පැරණි කාව්‍ය රැසක නෂ්ටාවශේෂ දක්නට ඇත. දඹදෙණි රාජධානි සමයේ රජකරන ලද දෙවැනි පැරකුම්බා නිරිඳුන් විසින් රචනා කරන ලද කව්සිළුමිණ සඳහා මූලාශ්‍රය කොට ගෙන ඇත්තේ ද කුස ජාතකයයිඃ

මෙසේ පෙර අවස්ථා දෙකක දීත් කුස ජාතකය කාව්‍ය නිර්මාණ සඳහා මූලාශ්‍රය කරගෙන තිබිය දීත් එය ම සීතාවක යුගයේ දී නැවත වරක් තම කාව්‍ය සඳහා ද පදනම් කර ගන්ට අලගියවන්න මුකවෙටිතුමා අදහස් කළේ හේතු කිහිපයක් නිසා බව සිතිය හැකි ය. ඉන් ප්‍රමුඛ හේතුව වන්නේ කුස ජාතකය ඒ වන විට ජනප්‍රිය කථා වස්තුවක් වී පැවතීම විය යුතු ය.

අනෙක විදේශීය සතුරන්ගේ එනම්, පෘතුගීසීන්ගේ පැමිණීමත් ස්වදේශිකයන්ගේ අවුල් වියවුලුත් නිසා සැම අතින් ම කරදරකාරී මෙන් ම පිරිහුණු තත්වයකට මෙරට ජනතාව පත් ව සිටි අභාග්‍ය සම්පන්න යුගයක විසූ උගතුන් කීපදෙනා අතර සිටි අලගියවන්න මුකවෙටි කවියා, දඹදෙණි රාජධානි සමයේ රචිත කව්සිළුමිණ ගැඹුරු අරුත් ඇති බැවින් කියවා තේරුම් ගත නො හැකි තත් කාලීන සමාජයේ විසූ ජනතාවගේ ප්‍රයෝජනය පිණිස මෙය රචනා කරන්ට ඇතැයි සිතිය හැකි ය.

මෙය මහාකාව්‍යයක් නොවේ. සර්ග 13කින් හා පද්‍ය 686කින් සමන්විත කොට විවිධ සිද්ධීන් ගෙන් පරිපූර්ණ වූ කුස

ද නම් බෝසත් සිරිත පද්‍යයට නැඟීමක් මෙහි දී සිදු වී ඇත. තෙරුවන් කෙරෙහි ඉමහත් ගෞරවයක් හා භක්තියක් ඇති ව සිටි ඔහු පැරණි හෙළ කවීන් අනුව යමින් බුදුන් වහන්සේ ප්‍රමුඛ කොට තෙරුවන්ට නමස්කාර කිරීමෙන් කාව්‍යය ආරම්භ කර ඇත.

මෙහි දී අලගියවන්නයන් සිදු කොට ඇත්තේ ජාතක කථාව හැකිතාක් දුරට ඒ ලෙස ම කවියට නැඟීමකි. දෙවැනි පැරකුම්බා නිරිඳුන් සිදු කළාක් මෙන් ජාතක කථාව තම අභිමතය පරිදි කපා කොටා සකස් කර ගැනීමට අලගියවන්න තැත් නොකළේය. ඔහුට ඊට හේතුවක් ද තිබිණ. එනම්, මේ කාව්‍යය රචනයට ඔහු යොමු වූයේ බුදුන් පෙර සිරිතක් ඇසීමේ කැමැත්තෙන් මැණික් සාමි නම් වූ කුල කාන්තාවකගේ ආරාධනය නිසා ය. මේ ඉල්ලීම සපුරාලීම සඳහා ජාතක කථාව කිසිදු කපා හැරීමකින් තොරව පරිපූර්ණ ලෙස කාව්‍යයට නඟා ඉදිරිපත් කිරීම ඔහු විසින් කළ යුතුව තිබිණ.

ජාතක කතාව දෙසූ බුදුන් වහන්සේගේ පරමාර්ථය වූයේ ස්ත්‍රීන් කෙරෙහි පිළිබඳ සිත් නිසා ඔවුන් කෙරෙහි ඇලීම කරණකොට ගෙන පුරුෂයන් හට වන්නා වූ ව්‍යසනයන් දක්වා ලීම ය. කුසජාතකය කවියට නැඟූ අලගියවන්නයන්ට ද මෙකී පරමාර්ථයෙන් බැහැර වන්නට අවශ්‍යතාවක් නොවී ය. එහෙත් මේ කාර්යයේ දී අලගියවන්නයන් අනුගමනය කළේ කෝට්ටේ යුගයේ දී වෑත්තෑවේ හිමියන් ගුත්තිල කාව්‍යයෙන් තහවුරු කළ කිසිදු ආකෘතියකට වහල් නොවූ නිදහස් කාව්‍ය රීතියකි. එය ජනප්‍රිය ලිහිල් බසක් යොදා ගත් සුගම රීතියකි. එසේ වුව ද වෑත්තෑවේ හිමියන් මෙන් සම්පූර්ණ සාර්ථකත්වයට ළඟා වීමට හේ සමත් වූ බවක් නොපෙනේ. ඊට හේතුව වෑත්තෑවේ හිමියන් ගුත්තිල කාව්‍යයෙන් හෙළි පෙහෙළි කළ ආකාරයේ විදග්ධ භාවයක් මෙන් ම එවන් ප්‍රතිභාවක් අලගියවන්නයන් කුසජාතක කාව්‍යයෙන් පෙන්නුම් නොකළ බැවිනි. එසේ ම ඔහු පැරණි සිංහල කවීන්ගේ ආභාසයෙන් මේ කාව්‍ය තුළ මුල් කොටසේ බහා ළන ලද ගතානුගතික වර්ණනාද තවත් හේතුවක් වන්නට ඇත. සාම්ප්‍රදයික නගර වර්ණනා ස්ත්‍රී වර්ණනා රාජ වර්ණනා තම නිර්මාණයට අයෝග්‍ය බව සලකා වෑත්තෑවේ හිමියන් ගුත්තිල

කාව්‍යය අසලට වැද්දගත්තේ නැති නමුදු අලගියවන්නයන් එවැනි සාම්ප්‍රදයික වර්ණනා එකතු කර ගෙන ඇති බව සැවැත් නුවර (22-34) හා කුසාවත් නුවර (80-93) වර්ණනයන්ගෙන් ද ඒවාට ම ඇතුළත් කොට ඇති ස්ත්‍රී වර්ණනාවලින් (16-18) (27-29) (82-85) ද කොසොල් රජු (35-40) හා ඔකාවස් රාජ (94-102) වර්ණනා ආදියෙන් ද තහවුරු වේඃ

කුසජාතක කාව්‍ය මුල් කොටසේ යොදාගෙන ඇත්තේ සාම්ප්‍රදයගත යෙදුම් ය. ඒවායේ නවමු බවක් දක්නට නැත. ඔහු ජන කාව්‍ය ලක්ෂණවලින් එල නෙලන්නේ ඉනික්බිතිව ය. එනම්, තුන්වන සර්ගයේ පටන් ය.

ජනකාව්‍යයන්හි විද්‍යමාන වන ප්‍රබල ලක්ෂණ කිහිපයක් වේ.

1 වෘත්තාන්තය වේගයෙන් ගලා යාම.

විදග්ධ රාජසභා කාව්‍යයන්හි මෙන් අනුචිත දීර්ඝ වර්ණනා වැද්ද ගැනීම නිසා ඇති වන කථා මාර්ගය අතරමඟ බිඳී යාමක් නොමැති වීම.

2 කථා මග තැන් තැන්හි අවස්ථාවට උචිත වන කෙටි වර්ණනා යොද ගැනීම. ඒ මගින් ලිඛිත මනෝභාව, මනෝගති, හැඟීම් යනාදිය ජනනය කෙරේ.

3 උපමා රූපක ආදි අලංකාර ජනනයට විශේෂ උත්සාහයක් නොගැනීම.

යොදගෙන ඇත්තා වූ අලංකාරොක්ති ස්වල්පය අයත්නයෙන් ගලා ආ ඒවා වීම.

4 මනෝහාරි ගුණයෙන් යුතු ව ස්ථානෝචිත ව්‍යංගාර්ථ මතු වීම.

මෙකී ලක්ෂණ අලගියවන්නයන්ගේ කුස ජාතක කාව්‍යයෙහි මුල් කොටසේ හැර සෙසු කොටස්හි එනම් තුන් වැනි සර්ගයේ පටන් තන්හි තන්හි දිස්වන්නේය. එහි දී ජනකවියකුගේ ප්‍රතිභානය පිළිබිඹු කෙරේ. පොදු ජනයාගේ සිත් ගන්නා ජාතක කථාවේ එන සැම සිද්ධියක් ම ඒ තැනට උචිත පරිදි වර්ණනා කර ඇත. ඒ කථා වස්තුව මෙසේ රමණීය ලෙස පද්‍යයට නැඟීම

නිසා කුස ජාතක කාව්‍යය ජනයාට ප්‍රිය වූයේත් විශේෂයෙන් පොදු ජනයා අතර ප්‍රකට වූයේ මේ හේතුවෙනි.

**සුභාෂිතය**

කෝට්ටේ යුගයේ දී වීදාගම මෛත්‍රේය ස්වාමීන් වහන්සේ විසින් රචිත ලෝවැඩසඟරාව මෙන් ම සීතාවක යුගයේ දී විවිධ සංස්කෘත උපදේශ ග්‍රන්ථවලින් ද කරුණු ලබා ගෙන සමාජයේ හා පුද්ගලයාගේ සංවර්ධනයට උපකාරී වන උපදේශ රාශියක් කැටි කොට අලගියවන්න මුකවෙටිතුමා විසින් රචනා කරන ලද පද්‍ය සියයකින් යුතු සුභාෂිතය ද සිංහල සාහිත්‍යයෙහි ඇති ඉතා ප්‍රකට මෙන් ම ජනාදරය දිනූ උපදේශ කාව්‍යයක් වෙයි. සුභාෂිත යනු යහපත් කියමන් ය. එවැනි යහපත් කියමන්වලින් සරසා පිළියෙළ කරන ලද හෙයින් මේ ග්‍රන්ථය සුභාෂිත කාව්‍යය නම් විය. අනතුරු ව කලක් ගතවන විට කාව්‍යය යන්න ව්‍යවහාරයේ දී ගිලිහී ගොස් සුභාෂිතය යන්න පමණක් මෙහි ග්‍රන්ථ නාමය වසයෙන් වර්තමානය වන විට ඉතිරි වී පවතී

මෙය රචනයේ දී සංස්කෘත සාහිත්‍යයේ ඇති උපදේශ ග්‍රන්ථ කිහිපයක ම ආභාසය ලබා ඇති බව ප්‍රකට යි.

සංස්කෘත සාහිත්‍යයේ නීති ශාස්ත්‍රීය ග්‍රන්ථ ලෙස හඳුන්වන්නේ අප උපදේශ ග්‍රන්ථ නමින් හඳුන්වනු ලබන ඒවා ම බව නිසැක ය. නීති ශාස්ත්‍ර යනු සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය කරන උපදෙස් උගන්වන ශිල්පය වේ. ඒ අනුව අලගියවන්නයන්ගේ සුභාෂිතය ද නීති ශාස්ත්‍රීය ග්‍රන්ථයක් ලෙස හැඳින්වීම නිවැරදිය.

සුභාෂිතය සැබවින් ම නීති ග්‍රන්ථයක් බව අලගියවන්නයන් පෙන්වා දෙන්නේ මෙසේ ය.

පුවළ නීති සත ගත පද අරුත් ලෙද
සිහළ බසින් සැකෙවින් කියමි පද බැඳ[6]

(මහ නීති පොත්හි දක්වෙන කරුණු අර්ථවත් ආකාරයෙන් සිංහල භාෂාවෙන් කෙටියෙන් කවියට නඟා කියමි.)

පින් මඳ පුතුන් සියයක් ලදුවත් නිසරු
ගුණ නැණ බෙලෙන් යුතු පුතුම ය ඉතා ගරු
එකපුන් සඳින් දුරුවෙයි ලොව ගන අඳුරු
නෙකතරු රැසින් එලෙසට නොම වේද දුරු[7]

සුභාෂිතයෙහි ඇති මෙවැනි පද්‍ය සීතාවක යුගයේ පටන් භාවිතයට පැමිණ ජනකවි බවට පත්වීමට තරම් විශේෂ වූ කාව්‍යමය ගුණ ඒවායෙහි ගැබ් ව ඇති බවට විවාදයක් නැත. ව්‍යවහාර භාෂාව යොදා ගැනීම, ස්වාධීන බව ප්‍රකට කිරීම, ආගමික කරුණු කෙරෙහි නැඹුරු වීම, සමාජ සත්‍යය හෙළි පෙහෙළි කිරීම, සරල මෙන් ම අව්‍යාජ බව, සාරධර්ම බාහුල්‍යය යනාදි පැති ගණනාවකින් ඒ විශේෂත්වය අපට හඳුනා ගත හැකි ය.

පහළ පොරණ ඉසිවර මුවෙනි මන නඳ
දෙමළ සකු මගද නොහසළ සතට දද
පුවල නීති සත ගත පද අරුත් ලෙද
සිහළ බසින් සැකෙවින් කියමි පද බැඳ[8]

යනුවෙන් අලගියවන්නයන් ප්‍රකාශ කරතත් පුරාණ ඍෂිවරයන්ගේ මුවින් තෙපලූ බස් ඒ ආකාරයෙන් ම ඉදිරිපත් කිරීමට වඩා ඊට යමක් එකතු කර ඉදිරිපත් කිරීමට ඔහු උත්සාහ ගෙන ඇති බව පෙනේ. කවියා කොතනින් කරුණු ගත්තේ වුව ද තමන් වෙසෙන සමාජ පැවැත්මේ යථාර්ථය හෙළි කිරීමේ අභ්‍යන්තර අරමුණ ඇතුව එය සිදු කොට ඇති බව පැහැදිලි වේ. එසේ ම තමා අවට සිටින සත් පුරුෂයන්ගේ යහගුණත් අසත් පුරුෂයන්ගේ දුර්ගුණත් හඳුන්වා දීමට කවියා වැඩි රුචියක් දක්වා ඇති බව ද සුභාෂිතයෙන් හෙළි වේ. වඩාත් පළල් ලෙස සිතා වඩාත් ප්‍රගතිශීලී ලෙස ද ස්වාධීනව ද තම අදහස ප්‍රකාශ කොට ඇති බව නුවණින් සුභාෂිතය කියවන අයෙකුට පෙනී යනු නො අනුමාන ය.

## කුස්තන්තීනු හටන

පෙදෙන් බුදු සිරිත් ආදිය ලිය යුතු යැයි යන සම්මතයක් අනුරාධපුර යුගයේ සිට මෙරට කවීන් අතර පැවැතිණ. එය

බෞද්ධාගමික රාමුවක් තුළ සීමා වීමක් ද වේ. එතෙක් ආගමික වශයෙන් පැවැති සිංහල සාහිත්‍යයේ මේ සීමාව ඉක්මවා යාමක් පසු කාලීන ව ගිහියන් සාහිත්‍යකරණයට අත ගැසීමත් සමග ඇති විය. කුස්තන්තීනු හටනින් පළ වන්නේ ද එකී සීමා නොඉවසා ඉන් බැහැරව ස්වාධීන මගක් ගැනීම ය. මෙය තත්කාලීන ආගමික සාමාජික ආර්ථික දේශපාලනික කරුණු රැසක් හෙළි පෙහෙළි කෙරෙන කෘතියක් ලෙස බොහෝ දෙනාගේ අවධානයට ලක්වන්නකි. ඓතිහාසික පුවතක්, ප්‍රශස්ති කාව්‍යයක් මෙන් ම හටන් සාහිත්‍යාංගයක් වසයෙන් ද මෙය අගය කළ හැකි ය.

හටන යනු යුද්ධය යි. කුස්තන්තීනු සා නම් වූ පෘතුගීසි සෙන්පතියකු විසින් කරන ලද සටන් මෙහි අතිශයෝක්තියෙන් වර්ණනා කොට ඇති බැවින් කුස්තන්තීනු හටන යනුවෙන් මේ ග්‍රන්ථය නම් කොට ඇත. කුස්තන්තීනු හටනට වස්තු බීජය වූයේ මෙරට මුහුදු බඩ පළාත්හි පෘතුගීසි පාලනය පැවැති කාලය තුළ සිදු වූ එක් පුවතකි. එය විස්තර කිරීමේ දී ඒ දෙස කවියා බලන ආකාරය මෙහි දී විශේෂත්වයක් පෙන්වයි. විමුක්තිකාමී ස්වදේශීය බලවේග හා ඒවාට නායකත්වය දුන් කුරුවිට රාළ (අන්තෝනි බරෙත්තු) වැනි වීරවරයන් ප්‍රතිකාල් රජුගේ ද්‍රෝහීන් ලෙස හංවඩු ගැසීමත්, අවමානයට හා නිග්‍රහයට ලක් කිරිමත්, ලංකාව ආක්‍රමණය කළ සිංහල ජාතියට හා බුදු සසුනට සතුරු වූ විදේශීය මංකොල්ලකාරයන් වීරවරයන් ලෙස සලකා අතිශයෝක්තියෙන් වර්ණනා කිරීමත් මෙහි දී සිදු වී ඇත.

සිවුපද කාව්‍යයක් වන මෙහි ඇතුළත් වන විරිත් කීපයකින් යුත් පද්‍ය සංඛ්‍යාව 189කි. එහෙත් ඇතැම් පිටපත්හි මෙකී සංඛ්‍යාව 175ක් ලෙස දැක්වේ. ඊට හේතු වී ඇත්තේ දියකෙළි වැනුමකට අයත් පද්‍ය 14ක් එහි අඩු වී ඇති බැවිනි.

අලගියවන්නයන්ගේ වෙනස්වීම එනම්, කිතුනු සමය වැලඳ ගැනීම 1616 දී පමණ සිදු වී ඇති බව පෙනේ. ඓතිහාසික තොරතුරු අනුව කුස්තන්තීනු ද සා ලංකාවට එන්නේ 1618 දී ය. ලෙල්ලෝ පිටියේ පැවැති සිංහල පෘතුගීසි සටන පදනම් කොට ගෙන එනම් ඓතිහාසික තොරතුරු අනුව කුස්තන්තීනු හටන

ක්‍රි. ව. 1619 දී පමණ ලියා ඇති බව සිතිය හැකි ය. ඒ හැර එහි කාලය පිළිබඳ කිසිදු සඳහනක් දක්නට නොලැබේ.

මෙහි කතුවරයා කවරෙක් ද යනු විවාදාපන්නය. සිංහල ජාතිය කෙරේත්, සිංහල රජුන් කෙරේත් බෞද්ධාගම කෙරේත් මහත් ආදරයක් භක්තියක් මෙන් ම උසස් ආකල්ප ඇතිව සිටි අලගියවන්න කවියා, සිංහල රටත් දයත් බුදු සමයත් විනාශ කරන්ට සැදී පැහැදී සිටි, පරංගීන්ට ලැදිව, ඔවුන්ගේ සෙන්පතියෙකු කෙරෙහි ගැති ව ඔහු සිංහල ජාතියට සතුරුව කළ සටනක් ඉමහත් ප්‍රශංසාවකින් යුක්තව වීරෝධාර ක්‍රියා ලෙස මහ ඉහළින් වර්ණනා කිරීමත් ඒ සෙන්පතියා වීරයෙකු කොට හුවා දැක්වීමත් කරන්නට ඇද්ද යනු සැකයට තුඩු දෙන්නකි. අලගියවන්න තමන් රචනා කළ සෑම කෘතියක ම පාහේ තම නම සඳහන් කොට තිබිය දී කුස්තන්තීනු හටනේ පමණක් ඒ පිළිබඳ සඳහනක් නොවීම මේ සැකයට තවත් අනුබල දෙන්නකි.

එහෙත් අලගියවන්නගේ රචනාවන් බව තහවුරු කෙරෙන අන්‍ය කාව්‍ය ග්‍රන්ථ හා සමග සසඳන කල කුස්තන්තීනු හටනෙහි දක්නට ලැබෙන රචනා විලාසයෙහිත් එකී සෙසු කාව්‍යයන්හි පැනෙන රචනා විලාසයෙහිත් සමාන ලක්ෂණ සලකා කෙනෙක් මෙය අලගියවන්නගේ ම කෘතියක් ලෙස සලකති.

කෙසේ වුව ද අලගියවන්න සිය සිතට එකඟ නොවන කාර්යයක නියැළි බැවින් කෘතියෙහි කර්තෘ නාමය සඳහන් නොකළා විය හැකි ය. එසේ ම ඔහුගේ අන්‍ය කාව්‍ය ග්‍රන්ථවල විෂය ක්ෂේත්‍රයට වඩා මෙය වෙනස් වූ නිසා ඊට ගැළපෙන ආකාරයට ආකෘතියේ හා අන්තර්ගතයේ ඇතැම් වෙනස්කම් කරන්ට ඇතැයි අපට සිතිය හැකි ය.

අලගියවන්නයන් සීතාවක රාජසිංහ රජුගේ අභාවයෙන් පසු පෘතුගීසීන් වෙත ගොස් ඔවුන්ට පක්ෂපාතිත්වය දක්වා ක්‍රිස්තියානි ආගම ද වැළඳගෙන, තනතුරු ගරුනාම හා ඉඩකඩම් ආදි වෙනත් ලාබයන් ද ලැබ ගෙන ඔවුන්ට සේවය කළ අයකු බව නොරහසකි. අලගියවන්න පමණක් නොව සීතාවක රාජසිංහ රජුගේ සේවයෙහි සිටි බොහෝ ප්‍රභූහු කිතු සමය වැළඳ

ගෙන ඔවුන්ට සේවය කළ බව සඳහන් ය. ඒ අනුව පෘතුගීසි සෙන්පතියකුගේ සිත් ගැනීමේ අදහසින් හෝ ඔවුන්ගේ ඉල්ලීම පරිදි කුස්තන්තීනු හටන අලගියවන්න අතින් ලියවෙන්ට ඇතැයි සිතීම ද යුක්ති යුක්ත ය.

කුරුවිට රාළ නම් සේන්පතියෙකු කලක් පෘතුගීසීන්ට එක් ව ක්‍රිස්තියානි සමය ද වැළඳ ගෙන අන්තෝනි බරෙත්තු නමින් ප්‍රකට ව අනතුරු ව පෘතුගීසීන්ට විරුද්ධ ව මැද්දේගම නුවර මායාදුන්නේ නම් ප්‍රාදේශීය නායකයෙකු හා එක්ව කැරලි ගැසීමට වූයෙන් එය මැඬලීමට කුස්තන්තීනු ද සා නොරොඤ්ඤෝ නමැති පෘතුගීසි සෙන්පතියා කළ සටන හා ඔහුගේ වීරත්වය හා යුද ජයග්‍රහණය වර්ණනා කිරීම මේ හටන් කාව්‍යයේ මුඛ්‍යාර්ය වූ බව පෙනේ.

හිලියගෙ පැහැ පත්
නළලැ තිලකෙක සිරි ගත්
ප්‍රතිකල් නමින් යුත්
දෙස උපන් සව්සිරිනි අග පත්

සක පිරි කිරි ලෙ සා
උබයකුල යුත් නිදො සා
කුස්තන්තිනු ද සා
නමැති ජනරජ තුමා වෙසෙ සා

සිය සෙන් ගෙන නොමි නි
සිරිලකට ගොඩ බසිම් නි
කළ රණ සමුදුරි නි
බිඳක් දක්වමි මනැණ පමණි නි[9]

මෙය සිංහල සාහිත්‍යයෙහි ඇති අමුතු මගක් ගත් කෘතියක් ලෙස හැඳින්විය හැකි ය. මේ අමුතු බව අංශ කීපයකින් ම දිස් වේ. දේශීය කවීන් සම්මතයක් ලෙස රැක ගෙන ආ බෞද්ධාග

මික රාමුවෙන් බැහැර වීම ඉන් පළමු වැන්න ලෙස පෙන්වා දිය හැකි ය. පැරණි සිංහල කවීන්ගේ සම්ප්‍රදය වූයේ කිසියම් කාව්‍ය ග්‍රන්ථයක් ආරම්භ කිරීමේ දී බුදුන් වහන්සේ ප්‍රමුඛ තෙරුවන් වැඳ නමස්කාර කොට සිය භක්තිය හා ශ්‍රද්ධාව ප්‍රකට කිරීම ය. සන්දේශ කාව්‍ය වැනි සුවිශේෂ ආකෘතියක් අනුගමනය කොට ලියවුණ කාව්‍ය කිහිපයක් හැර ගුත්තිල කාව්‍යය, කාව්‍යශේඛරය, බුදුගුණ අලංකාරය, සඳකිඳුරු ද කව, පැරකුම්බා සිරිත, කුසජාතක කාව්‍යය වැනි සිංහල සාහිත්‍යයෙහි පැනෙන ප්‍රමුඛ පෙළේ කාව්‍ය නිර්මාණ වැඩි හරියක් සිරිත් පරිදි පටන් ගැන්ම තෙරුවන් නැමදීමෙන් ම සිදුකර ඇති බව පෙනේ. අලගියවන්නගේ ම කාව්‍ය ග්‍රන්ථ බව තහවුරු කෙරෙන සුභාෂිතය, දහම්සොඬ කව හා කුස ජාතක කාව්‍යය ද ආරම්භ කරන්නේ මේ සම්ප්‍රදායට ම අනුගත වෙමිනි.

යට කී පරිදි සිංහල සාහිත්‍යාවලියෙහි එතෙක් පැවති බුදුන් ප්‍රමුඛ තෙරුවන්ට නමස්කාර කිරීමෙන් කාව්‍ය රචනාව ආරම්භ කිරීමේ සිරිත වෙනස් කළ පළමු වැන්න කුස්තන්තීනු හටන බව පෙනේ. ඒ වෙනුවට කුස්තන්තීනු හටනේ සිදු කර ඇත්තේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේට නමස්කාරයකි. එය දේශීය සාම්ප්‍රදයික කාව්‍යාකෘතිය නොසලකා හැරීමක් මෙන් ම ස්වාධීන මඟක් ගැනීමක් ලෙස ද සැලකිය හැකි ය.

බසකර අරුත මෙන
වෙනස නොම පෑ පවතින
පිති පුත් වීදි යන
තෙවක් එක් සුර වඳිම් අද රින

සව් ලෙව් සත් මුදුන්
සිය සිරිපා කමල දුන්
මෙත් ගුණ පිරි නඳුන්
වඳිම් යේසුස් ක්‍රිස්තු සුරිඳුන්

රිවිකැන් පහණකි න
නිකුත් නල සිළු විලසි න
කන්නිමරි කුසයෙ න
පහළ සුරිඳුන් වඳිම් බැතියෙ න[10]

තව ද කාව්‍යයේ අන්තර්ගතය අතින් බැලුවත් කුස්තන්තීනු හටනේ කැපී පෙනෙන විශේෂත්වයක් දැකීමට හැකි වේ. එතෙක් සිංහල සාහිත්‍ය ග්‍රන්ථවල සිරිතක් වසයෙන් වර්ණනාවට පාත්‍ර කරනු ලබන්නේ රටට ජාතියට හා ආගමට කිසියම් ආකාරයකින් වැඩකළ අභිමානයක් ලබා දුන් වීරෝදාර ක්‍රියාවන්ට සම්බන්ධ වූ ගෞරවාදරයට සුදුසු වූ රජවරුන් මැති ඇමතිවරුන් හෝ වෙනත් එවැනි ප්‍රභූවරුන් පිළිබඳව ය.

සැවුල් සන්දේශයේ දී සීතාවක රාජසිංහ රජු වර්ණනාවට ලක්කරන අප කවියා කුස්තන්තීනු හටන රචනයේ දී අතිශයෝක්තියෙන් වර්ණනා කරන්නේ තම මවු රටට, තමන්ගේ ජාතියට හා බුදු දහමට ඉතා දරුණු සතුරෙකු සේ කටයුතු කළ විදේශීය ආක්‍රමණිකයෙකු වූ කුස්තන්තීනු ද සා නොරොඤ්ඤෝ නමැති පෘතුගීසි සෙන්පතියෙකු පිළිබඳව ය. එයින් කවි කිහිපයක් මතු දැක්වේ.

පසක් සක් සිරි වන
ප්‍රතිකල් රජුට මන මෙන
සළු අබරණ වඩන
මහත් ගරුතර කුලෙන් පැවතෙන

මවුපිය පරපුරෙ න
සක කිරි සෙ පිරිසිදු වන
තම කුලඹර දිළෙන
සරා පුන් සඳ සිරින් හැමදින

යුද කොට රටින් රට
නොයෙක විරිදුන් මුලු පුට
එතම කිතු මුතු පට
සරා ලූ අට දිගඹුවන් කට[11]

ආදි වසයෙන් 38 වන පද්‍යයේ සිට 50 වන පද්‍යය දක්වා මේ වර්ණනාව ගලා යයි. අප සාහිත්‍යයේ එන සුපුරුදු රාජ වර්ණයකට සමාන ලෙස මෙහි කුස්තන්තීනු ද සා ගැන වර්ණනා කර ඇත. එය ප්‍රශස්ති කාව්‍ය ලක්ෂණ ද පිළිබිඹු කරන්නකි.

කුස්තන්තීනු ද සාගේ දෘඪ අධිෂ්ඨානය, අප්‍රතිහත ධෛර්යය, උද්‍යෝගවත් භාවය, දෘඪ ආත්ම ශක්තිය ධ්වනිත වන අයුරින්, සුලබ කාව්‍යෝක්ති මගින් වුව ද කෙරෙන වර්ණනා රසවත්ව හා අවස්ථානුකූලව සිදු කොට ඇත.

මායාදුන්නේ ර ද
සහ අන්තොනි බරෙත්තු ද
අප බල නොදන ත ද
පෙරළි අරයති වන්නි බද ඉ ඳ

ඔවුන් හට දී බැට
මෙලක් දිව එක්සත් කොට
මෙමා කිතු මුතු පට
පළඳවමි අට දිගඹුවන් කට

සත් සිඳු අගළ වට
සත්කුල පවුරු පසු කොට
නැඟී මෙර මුදුන ට
ගනිමි සුරපුර වත් සිතුවිට

ගෙන මෙජය කග පත
සමර මැද වැද නොනැව ත
සිඳ රුපු රදුන් ගත
කෙරෙමි රණ බිම පබළ සිඳු යුත [12]

කවියා කරන ලද ක්‍රියාවේ හොඳ නරක කෙසේ වෙතත් වීර රසය ජනනය වන පරිදි අවස්ථාවට ගැලපෙන සේ රචනා කොට ඇති මෙවන් පද්‍ය හටන් කාව්‍යයකට ඉතා ම උචිත බැව් කිව හැකි ය.

සුරත්හි ළෙල අවි කැලුමෙන් වෙසෙසේ
දිගත් සදා රිවි සුවහස් නැගි සේ
මහත් බලැති අග මැතිදෝ දෙප සේ
පිටත් වූය සුර සෙනඟක් විල සේ[13]

අලගියවන්නයන් පැරණි කවීන් යොදා ගත් උපමාදි අලංකාර ඒ හැටියට ම යෙදුවත් ඒවා අදාළ අවස්ථාව හා රසය මැවීමට ඉතාම යෝග්‍ය බව පෙනේ. එහෙත් ඇතැම් උපමා රූපක නිතර නිතර යොදා ගැනීම නිසා පුනරුත්ති දෝෂද මතු වූ තැන් නැත්තේ නොවේ. එසේ ම ඇතැම් නාම එකතු කරන ලද වට්ටෝරු පද්‍යයන් ද බහුලව යොදා ගෙන තිබෙනු දැකිය හැකි ය.

කාලත් තුවක්කු ත්
දිගුකර කයි තුවක්කු ත්
වෙඩි උණ්ඩ බේතු ත්
ලන්ස පටිසාන සහ නනවි ත්

රන් රිදී පෙට්ටි ත්
නන් වග පිළී කට්ටු ත්
ලුණුඹුල් දිය දර ත්
නංවමින් නන්වතුන් අනිකු ත්[14]

මේ කාව්‍යයේ මුල් හරියේ පද්‍යවලින් ප්‍රකාශ වන්නේ එවක පෘතුගීසි පාලනයට එරෙහිව මෙරට තැන් තැන්හි පැවැති විවිධ ක්‍රියාමාර්ග හා ඒ තත්වය පාලනය කිරීම් වස් කුස්තන්තීනු ද සා නම් වූ හමුදා නායකයා මෙරටට පිටත් කර එවීමේ ප්‍රවෘත්තිය යි. ඔහු මෙරටට ගොඩ බට අවස්ථාව මෙසේ දැක්වේඃ

කොළොම් පුර වදි මින
එහි රැඳි පදානින් ගෙන
සිරි ලකෙහි පවතින
පුවත් විමසා අසා දන ගෙන[15]

ඉන් අනතුරු ව ඇති පද්‍යවලින් කුස්තන්තීනු ද සා සිය පිරිවර සමග මල්වානට පැමිණීමත් ස්වකීය යුද දක්ෂතා පිළිබඳව ඔහුගේ පම්පෝරි ගැසීමත් විස්තර වේ. තදනන්තරව පෘතුගීසි හමුදාව යුද්ධයට සැරසුණු වීරෝධාර ලීලාව සටන්බිම පෑ වීරවික්‍රමාන්විත ක්‍රියා වර්ණනා කෙරේ. අනතුරුව ඔවුන් ගමන් ගත් මාර්ගය පිළිබඳ දීර්ග වර්ණනාවක් එයි. එය සිංහල සන්දේශවල එන මාර්ග වර්ණනාවලට බෙහෙවින් සමාන බවක් පෙනේ. එහි දී නොයෙක් භූගෝලීය තොරතුරු, ගම් දනව් හා නොයෙක් මග තොට හා ඇල දොල ආදිය පිළිබඳ වර්ණනා කෙරේ.

මේ සැටි ගෙවුයන් වතුපෙත් දිලෙ නා
ඕවිටි පිටි සුසැදුණු සස් වනි නා
රූකැටි අඟනන් තැන තැන සිටි නා
මා පිටි ගම සිරි නරඹා ගොසි නා[16]

රුවින් තුල්ල වන සුරනා ලිය නා
ලියන් ගොල්ල දිය කෙළිමින් යනෙ නා
පසන් වැල්ල යුතු මුතුපට ලෙසි නා
කනන් පැල්ල තොටිනෙතරව ගොසි නා[17]

දළ දළ පහරින් ගිනි රොන් ඉසිමි න
මුළ මුළ කෙණෙරුන් පොව්වන් සමඟි න
දොළ දොළ පැන බැස ගිලෙමින් කෙළිමි න
පළ පළ සිටි මත ගිජිඳුන් දකිමි න[18]

සමස්තයක් වසයෙන් ගත් කල නිරවුල් ව හා පැහැදිලි ව අදහස් ඉදිරිපත් කිරීමක් කුස්තන්තීනු හටනේ ඇති බැව් කිව හැකි ය. භාෂාව හා රචනා ලක්ෂණ අතින් විවිධ දුර්වලතා මෙහි ඇතත් අලගියවන්නයන්ගේ කවිත්වයේ විශේෂ ලක්ෂණ ද මෙහි නැත්තේ නොවේ.

මෙසේ අලගියවන්න කවියාගේ සාහිත්‍ය නිර්මාණ එකිනෙක වෙන් වෙන්ව ගෙන ගැඹුරින් විමසා බැලීමේ දී එදා සමාජයේ සෑම අංශයක් කෙරෙහි ම අවධානය යොමු කරමින් හෙතෙම සිය නිර්මාණ කාර්යයෙහි නියැළී ඇති බව පෙනේ. තමන්ගේ ආරක්ෂාවත්, කවියෙකු වශයෙන් තම පැවැත්මත්, පාලකයන් හා ප්‍රභූන්ගේ හොඳ හිත දිනා ගැනීමත්, සමාජය යහපැවැත්මත්, ශාස්ත්‍රීය කටයුතුවල උසස් තත්වයත් යන සෑම අංශයක් පිළිබඳව ම ඔහුට සිතන්නට සිදුවී ඇත. කෙසේ හෝ ඔහුගේ කාර්යභාරයේ වැදගත්කම එදාට මෙන් ම අදටත් ප්‍රබල ලෙස දැනී යන්නකි. එබැවින් ඔහු විසින් ඉටු කරන ලද සාහිත්‍ය සේවය වියතුන්ගේ අවධානයට වඩ වඩාත් පාත්‍ර විය යුතුය.

## ආන්තික සටහන්

1 ශ්‍රී ලංකාවේ ඉතිහාසය, - තෙවන කොටස, (2007) කොළඹ, සංස්ː හා ප්‍රකාː අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, පිටු, 240-244

2 සැවුල් සන්දේශය, (1968), කොළඹ, සංස්ː ආර්. පෙරේරා, කොළඹ, රත්නාකර පොත් ප්‍රකාශකයෝ, කවිය, 206, පිටුව, 151

3 - එම - කවිය, 34, පිටුව, 49

4 - එම - කවිය, 72, පිටුව, 68

5 සන්නස්ගලල පුඤ්ඤිබණ්ඩාර, 1994, කොළඹ, සිංහල සාහිත්‍ය වංශය, සංස්කෘතික දෙපාර්තමේන්තුව,පිටුව. 344

6 සුභාෂිතය, (1961) කොළඹ, සංස්: හා ප්‍රකාः අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කවිය,05, පිටුව, 04

7 - එම - කවිය, 20, පිටුව, 16

8 - එම- පිටුව, 16

9 කුස්තන්තීනු හටන, (2006), කොළඹ, සංස්: රෝහිණී පරණවිතාන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කවිः 4, 5, 6 පිටු, 21,22

10 -එම- කවිः 1, 2, 3 පිටුව, 21

11 -එම- කවි, 38, 39, 40 පිටුව, 26

12 -එම- කවි, 76, 77, 78, 79 පිටු, 30, 31

13 -එම- කවිය, 95, පිටුව, 33

14 -එම- කවි, 54,55 පිටුව, 28

15 -එම- කවිය, 65, පිටුව, 29

16 -එම- කවිය, 98 පිටුව, 33

17 -එම- කවිය, 100, පිටුව, 33

18 -එම- කවිය,105, පිටුව, 34

Book Review

## Mystical Survival: The Geography of the Infinitely Near

**Dr. Paulo Barone**

\Pilgrims Publishing, Varanasi, 2012, 113pp. INR 250/-, Paper, ISBN 978-81-7769-994-4

**"Ekam sat viprā bahudhā vadanti"**
**"Truth is one. The Sages call it by many names."**
[Rig Veda I.164.46]

This timeless dictum of the Rig Veda was resonating in my mind with a peculiarinsistency as I waded through this small book written by Dr.Paulo Barone undoubtedly for a very large purpose. I use 'wade through' with a cautious delight. This little book of 113 pages has a long title. The Mystical Survival: The Geography of the Infinitely Near. It is a collection of nine essays based on paperspresented by Dr. Paulo Barone at academicconclaves inandoutofIndia.

The nine essays taken together constitutes a painstaking effort to map a cohesive or perhaps a more pronounced direction 'along interrupted paths and intermittent times towards mutant places which seem to be solid and then reappears as gaseous part of a special geography which is not marked on current maps',his words (synopsis).

Dr. Paulo Barone in his role as a map maker and explorer of eternal truth, ageless wisdomand universalvalues known

to us as ‘SanathanaDharma’ identifies two core values for deeper excavation through his memoriesand experiences- Tolerance and Pluralism.

Hinduism, Buddhism and Jainism the three great religions that sprang from the deepest recesses of the Indian subcontinent are uncompromising in their adherence to the core elements of Tolerance and Pluralism. They make up the distilled essence of Hinduism, Buddhism and Jainism. This is deftly acknowledged by the author who cites Raimon Panikkar little further into the voyage of spiritual discovery. The sub title of the book ‘Geography of the Infinitely Near’ is no riddle after the reader manages the introduction. At this point I willingly succumb to the temptation of quoting Walter Benjamin. “Memory is not an instrument for surveying the past but its theater. It is the medium of past experience, just as the earth is the medium in which dead cities lie buried. He who seeks to approach his own buried past must conduct himself like a man digging"(Benjamin, 2006).

Dr. Paulo Barone commutes between two human settlements - Milan and Varanasi. Milan is a thriving metropolis with a history of memorable encounters with science, art and literature. Varanasi is the human habitat of ‘spiritual luminance’ and is the oldest living city in the world and the spiritual capital of the Indian subcontinent- home to three great religions Hinduism Buddhism and Jainism.

I should be forgiven fornot traversingall the territory that the map maker Paulo Barone discovers and marks. As he himself states in the introduction “The unpublished map of this singular territory, to be drawn up, must go as far as to almost be confused with it. It’s mapping out begins from the most unthinkable and remote localities, in the small marks

of each person; it proceeds by replacing their primitive borders (personal histories) by means of distant images…" (p.12). He concludes the introduction with reassuring words. **"Much as it is variable, I remain convinced that the map is oriented in only one direction. It is searching out Benares, the nebulous heart of things, our singular golden parasol. It is a passing map"** (p.12).

Why in search of Benares in the city of Varanasi? To each of us Benares offers a different idea, a brighter promise and a new experience. The waters of the Ganges can be tranquil or turbulent. The sun rise over the eternal city remains neutral to the prayers offered from ancient'Ghats" The thousands of shrines on the high banks of the river will remain impassive while one seeks to discover Existence, Consciousness and Delight or what the sages called 'Sachithanada'.

Paulo Barone embarks on his journey in search of a mystical survival after making this rather complex proposition in his introduction. In it he also makes a reference to Edward Said's landscape in ruins remark albeit in passing. It is no exaggeration to call it the city of the past, present and the promise of the future. It is indeed the city of eternity and continuity.

Then why does the author Paulo Barone see a landscape of ruin in it? (p.08). Then he proceeds to discover a second image of a 'compelling cherry flower about to fade and a third image as described by the poet Bharevi in Lotus pollen(Bharavi, Kiratarjuniya, V, 39).The ruin, the falling flower and the golden parasol according to the author makes an indivisible 'triptych-ruin'. In this triptych he discovers the elements that make up the 'original machine' (p.08).The author despite the tortuous path taken arrives at a pivotal

point where he abandons the Eurocentric perspective of landscape – ‘a visual dimension of space’.

The Benares he is in search of is a ‘singular golden parasol’ that cannot be reduced to visual dimensions. The City of light and the fountain of Hindu philosophy regarditself as a luminous space. Its luminosity exemplifies wisdom. It eradicates the darkness of ignorance. In this luminous space sin cannot be washed away in the Ganges or by prayer offered from the Ghats and Shrines. Immortality is possible only through wisdom and understanding. The City of light is not visible in darkness. The City of eternal wisdom through which the river of life meanders through does not defy the laws of physics. It however is home to the principleof non-contradiction(p. 31).

In the first essay “Vishva Darpana: East West Atlas, Notes on the Image of the World/ the Rest” (pp. 13-24), hedismantles Rudyard Kipling. Instead of attempting to make the twain meet the author makes it a confluence. In this essay his lament or rather his diagnosis of our predicament finds a natural setting in bustling Milan and in sedentary Varanasi with remarkable ease. He writes ‘we allow meaning to inherit only in the accurate gesture of a handshake or expression in some one’s eyes and still suffer the affliction of a general sense of exile’ (p.32) .”

The author is deeply influenced by Raimon Panikkar. I am no avid reader or follower of this great Indo Spanish savant. Yet, navigating the rapid currents of the author’s tireless reasoning, I was compelled to discover Panikkar afresh. It was not in vain. He is matchless on the subject. He says “philosophy could be understood as the activity by which man participates consciously and in a more or

less critical manner, in the discovery of reality and orients himself within the latter" (Panikkar,2000: 1-3).

In this essay he makes some startling discoveries. He refers to 'illusions produced when only a moment is extracted from a complex process and rendered absolute while the rest is obscured" (p.15). This essay does not make easy reading. The complex thoughts are presented in equally complex lines. Yet, your patience is soon rewarded. He begins the essay with a peg on James Joyce's Ulysses where Joyce uses the since famous phrase "light crumpled throwaway". The author decides that it is an 'appropriate image of the contemporaryworld' (p.13). It is no easy journey but it has exciting prospects. Walter Benjamin and James Joyce are invoked arrivingat life liberated 'Jeevanmukta' (p.19). The 'crumpledthrowaways' become 'remainders' and the reasoning is intricate. To see the Irish writer and the Jewish Marxist in the luminous setting of Varanasi is fascinating. As the author concludes, "[I]t is a specially made 'empty jar, an Atlas dedicated only to 'remainders' capable of holding them without asking anything of them in a semi liberated, semi redeemed state. To exhibit he suggests that "the East West Atlas must work like a laboratory" (p.19).

The Essay'Dagdhabijabhava:The State of the burntseed" (pp. 25-38) begins with a description of a visit by Rabindranath Tagoreto a Danish School. Tagore it is said had exclaimed "Why do you teach so many subjects? One would suffice: Hans Christian Anderson."

Tagore was a creative giant at ease with western culture. He had a deep insight in to western poetry and Science. He was a remarkable Indian sage who combined the best of East and West and a human repository of ancient

and modern knowledge. He held his own in a debate with Einstein in 1930 on the then emerging principles of quantum mechanics. The author Barone speculates on the reasons for Tagore's admiration for the Danish writer of fairy tales. Hans Christian Andersen is the acknowledged father of the modern form fairy tales. He was absolutely enchanting due to his extraordinary gift for noticing and depicting the whimsical and the wistful that mesmerized children and captured the imagination of adults.

The author speculates "It would indeed be nice to think that Tagore had once read one of Anderson's fairy tales and had been struck by a sudden, pervasive enchantment, of the sort generally reserved for children, whom he never forgot. Tagore might be said to have 'devoured' Anderson's fairy tales".

He picks the term devour from an observation made by Walter Benjamin in his "A Glimpse into the World of Children's Books." Hans Andersen's ingenious story of 'The Flax' becomes a commentary that is emblematic of the violent fragmentation that characterizes the reality in which we live. Then with remarkable conviction he asserts that "It also accurately represents the ever increasing speed with which modernity has managed to dissolve ancient rhythms and structures." Appreciation of Tagore's refrain in the Danish school that Andersen's stories provide an adequate education requires me to provide a synopsis of the story The Flax by Hans Christian Andersen.Started with a small incident and passing through long but interesting dialogues, the ballad was finally over (The Flax, hca. gilead. org.il, 1849).Just asthe Hedge Stake warned. When the flames died invisible elements danced over the embers. Wherever their feet touched, their footprints, the tiny red sparks, could be

seen on the ashes of the paper. But the tiny invisible beings cried, "The ballad is never over! The children could not either here or understand that. Just as well. Children should not know everything.

In my review I take pains to provide the synopsis of Andersen's story The Flax as it is necessary for me to explain how I understand Tagore's mind when he announces that Hans Andersen's stories as providing a wholesome education. The fables in the Panchatantra(re-print1991), the stories in the Jathaka Mala (re-print 2003) and the Fairy Tales of Hans Andersen(re-print 1993) all provide a great pool of accumulated wisdom that constitutes a perennial philosophy. They are all adventures in the human story. Sarvepalli Radhakrishnan says of Tagore "In interpreting the philosophy and message of Rabindranath Tagore we are interpreting the Indian ideal of philosophy, religion, and art, of which his work is the outcome and expression" (Radakrishnan, 1919: 12-15).

Here, I must digress. In order for me to appreciate the thesis of Paulo Barone I must take this avenue of citing an extract from the famous conversation between Tagore and Einstein. The conversation between these two eminent scholars was central to the nature of reality. Jathaka Stories, Fables of the Panchatantra and Hans Andersen's fairy tales are all part of the human entity which according to Tagore is "depending for its reality upon our consciousness"

In the essay 'The Ant-hill Fraternity' (pp. 39-44), the author uses the formation and functioning of the Anthill the abode of the industrious ants to present a world view. He commences the discussion by a reference to the Italian poet Giacomo Leopardi's composition ' La ginestra' or broom

plant.According to the author the poet Leopardi considered the broom plant as the only form of life surviving on the slopes of Vesuvius which destroyed a human civilization that was Pompeii and Ilocano in 79 AD.

Leopardi wrote the poem while residing in a villa on the hillside of Vesuvius. It was to be his moral testament as a poet. La ginestra ("The Broom") is contemplated by the poet as the flower of the barren slopes of the volcano.It describes desolation and the poet alternates between enchantment and melancholia of a starry night.It describes the nothingness of the world, the orphaned man and his precarious existence and the capriciousness of nature. These are not intended intentional evils but are continuous and constant. This commentary is followed by his thoughts on mankind, history and nature. The hapless plant Ginestra lives on in desolation typical of the Vesuvius without surrendering to nature. Here it personifies the ideal man who rejects illusions about himself and does not plead for help from the heavens.

Leopardi is not well known in the English speaking world. Yet he certainly could enter the ranks of the greatest enlightenment period thinkers. He perceives theflower of a broom plant growing on the arid slopes of the volcano Vesuvius as confrontation with the delusions of his time which believed in a ‘magnificent progressive fate’ – and those who failed to recognize the malignity of Nature towards humans. Paulo Barone reads another dimension to his poetry. He believes that the 19th century poet was concerned and commented on the ‘the extreme ease and rapidity with which things vanish and the relentless fragility to which they are subject and the illusive nature of edifying visions. Leopardi in his poetry refers to tribe of ants, carved out of soft soil, with vast labour. The poem gives a sense of a

'concluding remark' saying that "it's for no other reason than that mankind is less rich in offspring". The task of philosophy (filosofia dolorosa ma vera) is to educate humanity first to openly recognize the ills of life and then to mitigate them through participation in the culture of time. It is the message encoded in 'La Ginestra' (the Broom). Leopardi calls for a great alliance of all human beings a 'social chain (social catena) that unites all against the brute force of nature. Leopardi refuses the idea of Divine Providence and all the silly ideas of his proud and simple century. Our author Barone impressed with this philosophical view encapsulated in the La Ginestrabut locates his thought somewhere in explaining the illusive nature of edifying visions.

Barone says the analogy with the ant hill is well known in India. He cites Brahmavaivarta Purana Krisnajanma Khanda as remembered by Heinrich Zimmer in his Myths and Symbols in Indian Art and Civilization (1972).In the Upanishads we discover Indra swollen with pride. He decides to build a palace that will testify to his great powers. But the construction drags on.The head carpenter discovers that this would take a life time. Surely Indra must be persuaded to be a little modest in his dreams of grandeur. He consults Brahma the God of Creation. They decide on a strategy. A mysterious person appears one day and Indra proudly proceeds to show the guest around. The visitor is impressed and declares that it is the finest abode any Indra has ever built. AnyIndra? Indra was confused. I am the only Indra. Am I not? The visitor obviously a messenger from Brahma the creator points to a procession of ants walking in orderly formation over the palace floor. "Those ants," the messenger says, "are all former Indras!" It is the way of the world. A god in one life time can be reincarnated as an ant in another. One must avoid being

too comfortable in one’s own esteem aswe never know what kind of karma you're building in the present life.

Buddhist texts too have relied on the symbolism of the Anthill. There is an anthill burning day and night. A Brahamin directs another person Sumedha 'Take your tool, Sumedha and dig.” As they dig deep he comes across a door-bar, a frog, a forked path, a strainer, a tortoise, a butcher’s knife and chopping block, a piece of meat. They throw these findings away and dig deeper. They finally find a cobra. The Cobra is not harmed but treated with honour. They are baffled by these findings. At the behest of a deity (Devata) the riddle is referred to the Buddha. The enlightened one unravels the riddle. The Ant Hill is the body. The Brahmin is the Arahat. The Knife denotes wisdom. The digging is the effort. The door bar is ignorance. The fork in the path is doubt. The Sieve is the five mental hindrances;the tortoise is the five aggregates of clinging. The Butchers knife and the choppingblock represent the fivefold pleasures of sense. The piece of meat is lust and delight. The Cobra is the Arahat Monk (Vammika Sutta, Majjhima Nikaya 23).

The Anthill the product of effort to overcome adversity, consistency in application to life, commitment to ethical conduct by the miniscule insect that is oblivious to its own existence has captured the imagination of both the oriental and occidental exponents of human frailty and human endurance.

In the essay ‘White of India’ (pp. 45-58) the author enters exciting territory- The Impact of India. Here it must be stressed that in his impatience to unburden himself of the vast array of observations, inferences and determinations of his subject he does not seriously consider the limited faculties

of the reader to fully grasp his message. The language and the construction of thoughts can at times be arduous.

He writes "By far the majority of the numerous accounts of the impact of India (which is the East, but is definitely much more, and East which is never really India, but always much less) reveal a common trait. While the overarching message is discerned the reader feels a sense of helpless despair that nags the mind. What if the conjecture is incorrect? That said Paulo Barone should be seen as a serious explorer of the 18th and 19th century east west philosophy encounters. He deals with what he calls the 'emblematic case of Hegel' (p.46).

Hegel was no student of Hindu Philosophy. His views are confined to his review of Wilhelm von Humboldt's lectures on the Bhagavad-Gitaat the academy of Sciences, Berlin in 1827. Humboldt praises the Gita as the greatest, most beautiful, andphilosophical poem in all known literatures. For the purpose of this review of Paulo Barone's book that deals with East West concept of God and Man let us see how the Gita and Hegel visualized and interpreted God.

In the Gita Krishna is God incarnate. Krishna, is one (and many), supreme, infinite, all-encompassing, all-pervasive omnipotent , the beginning less and endless, immortality and death being and non-being and beyond neither being nor non-being source of all and especially of all that is excellent , personal, self-revealing , indweller in human beings savior of sinners , the guardian of eternal sacred duty, destroyer and dissolution. God is the universal father, mother, friend, lover, grandfather. God is manifest in nature and mind, as the sustaining life force, a teacher, illuminating the entire field.

Hegel does not subscribe to this conception of god. If God is to be truly infinite, truly unlimited, then God cannot be ‘a being’, because ‘a being’, by definition is already limited by its relations to the others. But if God is not a being’, what is God? If finite things fail to be real, what it is to be depends on the relation to other finite things?(Lauer, 1983).

Hegel’s God performs something akin to what is traditionally understood as ‘creating’. But as the Hegelian ‘creating’ takes place throughout time, rather than only ‘in the beginning’, it finds itself consistent with what astrophysics and biology informs us about the universe (Lauer, 1983). Thus even Karl Marx- the atheist can describe Hegel as an inspirational guide!

These are random meanderings in which I found myself immersedwhentrudgingalongthe113pagesthatPauloBarone hasproduced.Itisindeedthesumofalifelongquestofdiscovery. Paulo BaroneinhisMysticalSurvivaloffersarevelatory prismthroughwhichtoview the present situations,conditions and inoverallthecurrentand evolving conceptions of human thought and interactions. This is an exciting journey for the initiated and a rather mystical journey for the uninitiated such myself. I am glad that I read it. I look forward to an amplified version where he explains his wanderings shall we say as Hans Anderson tells a story to Children.

Reviewed by:

Anuththaradevi Widyalankara, PhD
Senior Lecturer
Department of History
University of Colombo-SRI LANKA